*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2018 වර්ෂය සඳහා පොලොන්නරුව දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,075 - 2018 ජුනි මස 08 වැනි සිකුරාදා - 2018.06.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1012 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1020 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1028 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2018 මැයි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජුනි මස 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජුනි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## පානදුර ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු වී ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

විවෘත බඳවා ගැනීම

| *අනු අංකය* | *තනතුරු හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 1. | සෞඛ්‍ය පරිපාලක<br>III ශ්‍රේණිය<br>තනතුරු 02<br>වැටුප් කේත අංකය MN 1- 2016<br>මාසික 27140-10 x 300 - 11x350-10 x 495-10 x 660 -රු. 45540 | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. |
| | ක්ෂේත්‍ර පරිපාලක<br>III ශ්‍රේණිය<br>තනතුරු 01<br>වැටුප් කේත අංකය MN 1-2016<br>මාසික 27140-10x300-11x350-10x495-10x660-රු. 45540 | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. |
| 2. | කාර්යාල කාර්ය සහායක<br>III ශ්‍රේණිය<br>තනතුරු 01<br>වැටුප් කේත අංකය PL 1- 2016<br>මාසික 24250-10x250-10x270-10x300-12x330 -රු. 36410 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත්වී තිබීම. (මින් විෂයයන් (05) ක් එකවර සමත් විය යුතුය.) |
| 3. | ක්ෂේත්‍ර කම්කරු<br>III ශ්‍රේණිය<br>තනතුරු 01<br>වැටුප් කේත අංකය PL 1-2016<br>මාසික 24250-10x250-10x270-10x300-12x330 -රු. 36410 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. |

| *අනු අංකය* | *තනතුරු හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 4. | සෞඛ්‍ය කම්කරු<br>III ශ්‍රේණිය<br>තනතුරු 05<br>වැටුප් කේත අංකය PL 1- 2016<br>මාසික 24250-10x250-10x270-10x300-12x330 - රු. 36410 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. |
| 5. | පුස්තකාල සහායක<br>III ශ්‍රේණිය<br>තනතුරු 03<br>වැටුප් කේත අංකය PL 1-2016<br>මාසික 24250-10x250-10 x270-10 x 300-12 x 330-රු. 36410 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත්විය යුතුය.) |

සීමිත බඳවා ගැනීම

| *අනු අංකය* | *තනතුර හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 6. | සෞඛ්‍ය පරිපාලක<br>III ශ්‍රේණිය<br>තනතුරු 02<br>වැටුප් කේත අංකය MN 1 - 2016<br>මාසික 27140-10x300-11x350-10x495-10x660-රු. 45540 | අ.පො.ස. (සා.පෙළ)<br>විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත්වී තිබිය යුතුයි) |
| | පළපුරුද්ද<br>පළාත් පාලන ආයතනයක PL-1 හා PL -2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05)ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය. | |
| 7. | ක්ෂේත්‍ර පරිපාලක<br>III ශ්‍රේණිය<br>තනතුරු 01<br>වැටුප් කේත අංකය MN1-2016<br>මාසික 27140-10x300-11x350-10x495-10x660-රු. 45540 | අ. පො. ස. (සා. පෙළ)<br>විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) කින් සාමාර්ථය ලබා තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත්වී තිබිය යුතුයි) |
| | පළපුරුද්ද<br>පළාත් පාලන ආයතනයක PL-1 හා PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය. | |

1. බඳවා ගැනීමේ පොදු කොන්දේසි

(i) අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වසර 03ක කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(iii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(iv) විවෘත බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනට අවු. 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. සීමිත බඳවා ගැනීම සඳහා දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතුවූවන්ට මෙම වයස් සීමාව ආදළ නොවේ.

(v) 2013.01.01 වැනි දිනට පෙර අනුමත වී ඇති බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් ඇතැම් කරුණු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද 2013.01.01 වැනි දිනට පානදුර ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩල වාර්තාවේ සඳහන් තොරතුරු හා අංක 1859/32. 2014.04.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බලතල පැවරීම උපලේඛනයෙහි සඳහන් තොරතුරු සමග නොගැලපෙන අවස්ථාවන්හි දී බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් අදළ කොන්දේසි වෙනුවට ඉහත අවස්ථා දෙකෙහි කොන්දේසි අදළ පරිදි ආදේශ වනු ලැබේ.

(vi) අදළ බඳවා ගැනීමේ පටිපාටිවල විධිවිධාන අනුව එක් එක් තනතුරට අදළව විධිමත් ලිඛිත පරීක්ෂණ/වාචික පරීක්ෂණ/ ප්‍රායෝගික පරීක්ෂණ/ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ/සම්මුඛ පරීක්ෂණ වලින් එකකට හෝ කිහිපයකට හෝ සියල්ලටම අයදුම්කරුවන් යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ. කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් ගනු ලබන තැනැත්තා කවුරුන්ද යන්න පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතුය.

(vii) කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ/ප්‍රායෝගික/ලිඛිත පරීක්ෂණවලට භාජනය කළ පමණින් බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස සලකනු නොලැබේ.

2. බඳවා ගැනීමේ ක්‍රමය

* සෞඛ්‍ය පරිපාලක හා ක්ෂේත්‍ර පරිපාලක (විවෘත/සීමිත) තනතුරු සඳහා ලිඛිත විභාගයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

* පුස්තකාල සහායක, කා. කා. ස. ක්ෂේත්‍ර කම්කරු හා සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

* සෞඛ්‍ය පරිපාලක තනතුරු 02 හා ක්ෂේත්‍ර පරිපාලක තනතුරු 01 සඳහා සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන්නේ නම් පමණක් විවෘත අයදුම්පත් මගින් පුරප්පාඩු පුරවනු ලැබේ.

3. ලිඛිත පරීක්ෂණය - සෞඛ්‍ය පරිපාලක, ක්ෂේත්‍ර පරිපාලක

| *විෂයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 100 | 40% |

4. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* : - කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමේදී සලකා බලන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |

5. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* : - ක්ෂේත්‍ර කම්කරු හා සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමේදී සලකා බලන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

7. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් අවුරුදු 01ක පරිවාස කාලයකට යටත් වේ.

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය)

(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද බස්නාහිර පළාත් සහ මූල්‍ය නීති සංග්‍රහයටද කලින් කල බස්නාහිර පළාතේ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලටද, අනුව කටයුතු කළ යුතුය.

8. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්‍ෂණය අදල තනතුරු සඳහා ලිඛිත පරීක්ෂණට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු රියදුරු බලපත්‍රය

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.
(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,
(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
(v) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (මින් 01ක් ග්‍රාම නිලධාරියාගෙන් ලබාගත් එකක් විය යුතුය.),
(vi) පළපුරුද්ද පිළිබඳ සහතික,
(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

10. අයදුම්පත් සමඟ ඉහත (i) සිට (vii) දක්වා ඇති ලියවිලි අමුණා එවීමට කටයුතු කළ යුතුය. එසේ නොකළහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවද සැලකිය යුතුවේ. එමෙන්ම ඉහත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරන බව දන්වා සිටිමි.

11. වෘත්තීය තොරතුරු සමඟ සම්පූර්ණ ජීව දත්ත ඇතුලත් තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් අදළ සියලුම සහතික වල පිටපත් ද සමඟින්, 2018.06.22 දින හෝ එදිනට පෙර ''ලේකම්, පානදුර ප්‍රාදේශීය සභාව, වාද්දුව'' ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ලේකම්,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

06-389

---

**මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ උකුවෙල ප්‍රාදේශීය සභාව සඳහා**

පුස්තකාල සහායක/කාර්යාල කාර්යය සහායක/සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීම

2017.05.26 දිනැති *ගැසට් නිවේදනය* මගින් ප්‍රසිද්ධ කළ පුරප්පාඩු පුස්තකාල සහායක/කාර්යාල කාර්යය සහායක තනතුරු සඳහා බඳවා ගැනීම අවලංගු කර ඇති බැවින් ඒ සඳහා ඉල්ලුම් කළ අයදුම්කරුවන් මෙම දැන්වීම අනුව නැවත අයදුම්පත් යොමු කරන ලෙස දන්වමි.

02. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ උකුවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති උකුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුල ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (උකුවෙල ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, ආදේශක සේවකයින්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ)

**උපලේඛනය**

| තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| පුස්තකාල සහායක III පන්තිය | 01 | වැටුප් කේත අංකය PL -1 රා.ප.ච. 3/2016 අනුව වැටුප රු. 24250-10 x 250-10 x 270-10 x 300 - 12x 330-36410/= රා.ප.ච. 3/2016 හි උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ. (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |
| කාර්යාල කාර්යය සහායක III පන්තිය | 02 | | |
| සෞඛ්‍ය කම්කරු III පන්තිය | 01 | | |

03. *සැළකිය යුතුයි* :- සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා පමණක් ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථා වලදී පමණක් අවම අධ්‍යාපන සුදුසුකම 5 ශ්‍රේණිය සමත් වීම ලෙස සළකා කටයුතු කරනු ලැබේ.

04. *කායික සුදුසුකම්* :- සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

05. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම්* :-

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
ii අයදුම්කරු අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 3 ක කාලයක් උකුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
iii අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් උකුවෙල ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටි ස්ථිර තනතුරු දරන අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
iv. උකුවෙල ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික අනියම් ආදේශක කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයන් කෙරේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.
v. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් සිටිය යුතු අතර දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
vi. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.

06. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි* :-

i. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.
ii. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.
iii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.
iv. මෙම බඳවාගැනීම් කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද මධ්‍යම පළාත් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

07. *අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන* :-

i. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු යඃ-

(a) උප්පැන්න සහතිකය
(b) අධ්‍යාපන සහතික
(c) තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය

(d) මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙනි)
(e) වෘත්තිය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික ඃ
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් නම් අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය)

08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.
09. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
10. අයදුම් කළ යුතු ආකාරය ඃ-

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2018/06/22 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ **ලේකම්, ප්‍රාදේශීය සභාව, උකුවෙල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය) නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය උකුවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ආර්.ජේ.එන්. ජයසිංහ,
ලේකම්,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

2018 මැයි මස 23 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය සභා කාර්යාලය.

උපලේඛනය

**ආදර්ශ අයදුම්පත්‍රය**

උකුවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පුස්තකාල සහායක/කාර්යාල කාර්යය සහායක/සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීම

01 අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————————.
02 මුලකුරු සමග නම :——————————————.
03 ස්ථිර ලිපිනය :——————————————.
04 දුරකථන අංකය :——————————————.
05 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.
06 උපන් දිනය ඃ- වර්ෂය :——————. මාසය :——————. දිනය :——————.
07 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :——————.
08 ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
09 විවාහක/අවිවාහක බව :——————————————.
10 ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
11 ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :——————————————.
12 අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න)
අ.පො.ස. (සා.පෙළ) විභාගය

සමත් වර්ෂය ඃ විභාග අංකය ඃ

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* | *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

අ.පො.ස. (උ.පෙළ) විභාගය

සමත් වර්ෂය :                    විභාග අංකය :

| අනු අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

13. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :——————————————.

14. වෘත්තීය සුදුසුකම් :——————————————.

(i) සේවා පලපුරුද්ද :——————————————.
(ii) දැනට සේවය කරන ආයතනය :——————————————.
(iii) දැනට දරන තනතුර :——————————————.
(iv) එම තනතුරට පත් වූ දිනය :——————————————.
(v) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————————.

15. ඔබ දැනටමත් මෙම සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්,

(a) දැනට දරන තනතුර :-
(b) ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් ආදේශක යන වග දැ:-
(c) එම තනතුරට පත් වූ දිනය :-

16. ඔබ කවරදායක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

..............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..............................................,

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

.................................................... මයා/මිය/මෙනවිය මෙම ආයතනයේ ...................................................... වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..............................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : ..............................................,

06 - 562

# පළාත් පාලන නිවේදන

## මාවතගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 සහ 24(2) වැනි වගන්ති යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර වයඹ පළාත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති මාර්ගය මාවතගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මාර්ගය සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය ප්‍රාදේශීය සභාව සතු මාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි. (මානකතැනගේ නම - එච්. එම්. හේරත්, පිඹුරු අංකය - 8525, දිනය 2009.05.30).

මෙම මාර්ගය ගොඩනැගිලි සීමාවේ සිට අඩි 25 බව ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ජී. නිශාන්ත කුමාර,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
මාවතගම.

2018 මාර්තු මස 21 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

පාරේ නම - වැලිගොඩේ හේන මාර්ගය.
ආරම්භය - ප්‍රාදේශීය මාර්ගය ලොට් 03.
අවසානය - ලොට් 11.
පාරේ දිග - මීටර 110.

පාරේ වම්පස හිමියන් :

01. මපාස් මයා
02. නසාර් මයා


පාරේ දකුණුපස හිමියන් :

01. එම්. ජෙ. අමාන් උල්ලා මයා
02. එම්. ජී. මොම්මදු ජවතුල්ලා මයා
03. එම්. ජී. මොහමඩ් හිබතුල්ලා
04. එම්. ජී. රහුමතුල්ලා මයා
05. එම්. ජේ. මොහමඩ් ජේපරුල්ලා මයා

එච්.එම්.එස්. හේරත් F.S.I.
සාමදාන විනිශ්චයකාර සහ
බලයලත් මිනින්දෝරු සහ තලමිනින්දෝරු
උසාවියේ කොමසාරිස් සහ තක්සේරුකරු
15, මුහන්දිරම් විජේතුංග මාවත,
මිගමුව පාර, කුරුණෑගල.
දුරකථන අංකය : 037-2233958

පිඹුරු අංකය : 8525

යොමුව.
මා : මායිම් සලකුණ
කපෑවැ : කම්බි පැළ ඉණි වැට
ජ් : ජීවී ගොඩනැගිල්ල
අ : අත්තිවාරම



පරිමාණය 1 : 1000 යි.
වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ
වැලව විල්ලි හත්පත්තුවේ වැලව කෝරලේ ගම්මානයේ පිහිටි
" වැලිගොඩ හේන " නමැති ඉඩමින් කොටසක් මැන සාදන ලද

පිඹුර

| කැබලි අංකය | හෙක්ටයාර් | අ. | රූ. | පැ. |
|---|---|---|---|---|
| 1 | 0.0455 | 0 | 0 | 18.00 |
| 2 | 0.0455 | 0 | 0 | 18.00 |
| 3 | 0.0455 | 0 | 0 | 18.00 |
| 4 | 0.0455 | 0 | 0 | 18.00 |
| 5 | 0.0455 | 0 | 0 | 18.00 |
| 6 | 0.0518 | 0 | 0 | 20.50 |
| 7 | 0.0608 | 0 | 0 | 24.00 |
| 8 | 0.0240 | 0 | 0 | 09.50 |
| 9 | 0.0266 | 0 | 0 | 10.50 |
| 10 | 0.0493 | 0 | 0 | 19.50 |
| 11 | 0.1088 | 0 | 1 | 03.00 |
| එකතුව | 0.5488 | 1 | 1 | 17.00 |

ඉඩමේ මායිම් පිඹුරේ සඳහන් පරිදි වේ.
මැනීම / නොටම් හිරම 2008/05/30 දින.

බලයලත් මිනින්දෝරු

06 - 407

**තංගල්ල නගර සභාව**

මාර්ග ලේඛනය

**සංශෝධනය කිරීම**

නගර සභා ආඥපනතේ (255 වන අධිකාරිය) 49 වැනි වගන්තිය ප්‍රකාරව තංගල්ල නගර සභාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි තංගල්ල නගර සභා බල ප්‍රදේශය තුළ තංගල්ල නගර සභාව සතු මංමාවත් ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 2037 හා 2017 සැප්තැම්බර් මස 15 වැනි සිකුරාදා දිනෙන් ප්‍රකාශයට පත්කරන ලද මංමාවත් අතුරින් අංක 01 යටතේ දක්වන ලද මුහුදු මාවතෙහි තොරතුරු පහත උපලේඛනයෙහි පරිදි සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරනු ලබයි.

අජිත් උපුල් පලල්ල විතානගේ,
ලේකම්,
තංගල්ල නගර සභාව,
තංගල්ල.

*උපලේඛනය*

| *පාරේ නම* | *පාරේ දිග* | *පළල* | *ආරම්භක ස්ථානය* | *අවසාන ස්ථානය* | *ග්‍රාම නිලධාරි වසම* |
|---|---|---|---|---|---|
| 01. මුහුදු මාවත | 665m | 5.5m | මාතර - තංගල්ල ප්‍රධාන මාර්ගය | සර්කියුලර් පාර | කොටුවේගොඩ |

06 - 463

---

**මතුගම ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කර ඇති මංමාවත් මතුගම ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය පළ වූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙරිල් මුණසිංහ,
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව.

2018 මැයි මස 21 වැනි දින,
මතුගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උප ලේඛනය**

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ දිග මීටර් | මාර්ග යේ පළල මීටර් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | ග්‍රා.නි. වසම |
|---|---|---|---|---|---|---|
| 1 | මඩවල තිත්තකැකිරිහේන පාර | 1000 | 3.65 | වැලිපැන්න ඌරගොඩ මාර්ගයේ පල්ලෙ මුල්ල | ගල්කඩුව - ඌරගොඩ මාර්ගය | 793 ඩී මඩවල |
| 2 | ඉද්දගොඩ මාස්ලියැද්ද පාර | 111 | 3.65 | ගුරුදොල පාර | කුසුමා ජයලත් මහත්මියගේ ඉඩම | 806 බී හිරිකැටිය |

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ දිග මීටර් | මාර්ග යේ පළල මීටර් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | ග්‍රා.නි. වසම |
|---|---|---|---|---|---|---|
| 3 | සෙන්ට්‍රල් ගාර්ඩන් ප්‍රධාන මාවත | 700 | 6.0 | ආඳගල පාර | එච්. ඒ. සී. ඩී. ඒ. සෙනෙවිරත්න මහතාගේ ඉඩම | 805 මතුගම නැගෙනහිර |
| 4 | සෙන්ට්‍රල් ගාර්ඩන් 1 වන මාවත | 52 | 3.0 | සෙන්ට්‍රල් ගාර්ඩන් ප්‍රධාන මාවත | ජී. ඩී. පත්මසිරි මහතාගේ ඉඩම | 805 මතුගම නැගෙනහිර |
| 5 | සෙන්ට්‍රල් ගාර්ඩන් 2 වන මාවත | 43 | 3.0 | සෙන්ට්‍රල් ගාර්ඩන් ප්‍රධාන මාවත | බී. ඩී. පත්මසිරි මහතාගේ ඉඩම | 805 මතුගම නැගෙනහිර |
| 6 | සෙන්ට්‍රල් ගාර්ඩන් 3 වන මාවත | 61 | 4.57 | සෙන්ට්‍රල් ගාර්ඩන් ප්‍රධාන මාවත | රමණී කළුආරච්චි මහත්මියගේ | 805 මතුගම නැගෙනහිර |
| 7 | දෝනමුල්ල පාර | 234 | 3.6 | මතුගම කළුතර ප්‍රධාන මාර්ගයේ කඩවක ප්‍රදේශයෙන් වමට | ඩී. එච්. ජානක මහතාගේ ඉඩම | 844 A වැලිමානාන |
| 8 | ගොඩහේන් කන්ද පාර | 254 | 3.6 | සුදන්ගෙදර හේවාගොඩ පාර | ඩබ්. ජී. අජිත් ප්‍රසන්න මහතාගේ ඉඩම | 795 ඕවිටිගල |
| 9 | කටුගහහේන ජයවර්ධන ගොඩ පළමු අතුරු මාර්ගය | 147 | 3 | කටුගහහේන හන්දියේ සිට කොටගෙදර දක්වා ගමන් මාර්ගය | විල්ඩින් නෝනා මහත්මියගේ ඉඩම | 798 කොටගෙදර |
| 10 | ඕවිටිගල කට්ටඩිගොඩැල්ල | 77 | 6 | මතුගම අළුත්ගම මාර්ගයේ කඩිත්ත මංකඩ පාලම | කඩිත්ත මංකඩ ඇල හා කුඹුර | 795 ඕවිටිගල |
| 11 | නවුත්තුඩුව දෙල්ග ස්ගොඩ මාවත | 900 | 4.5 | නවුත්තුඩුව අළුත්ගම මාර්ගයේ නවුත්තුඩුව හන්දියේ සිට කීරන් තිඩිය දෙසට හමුවන පළමු පාලම අසලින් දකුණට | අයි. පී. බන්දුල ප්‍රේමසිරි මහතාගේ ඉඩම | 796 A අළුත්ගම්ගොඩ |
| 12 | කුඩලිගම කන්ද පාර පලවන අතුරු මාර්ගය | 442 | 3.65 | කුඩලිගම කන්ද පාර | ඉද්දගොඩ දෙනිය 1 වන පටුමග | 806 ඉද්දගොඩ නැගෙනහිර |
| 13 | අළුබෝගහලන්ද මාර්ගය | 154 | 6 | මතුගම අගලවත්ත ප්‍රධාන පාර | ජී. වී. සිරිවිමල් මහතාගේ ඉඩම | 805 D වැත්තෑව |
| 14 | අළුබෝගහලන්ද පළමු හරස් මාර්ගය | 80 | 3.6 | පිඹුර අංක 1519 කැබලි අංක 10 දරන එස්. ඒ. චාන්දනී විනීතා මියගේ ඉඩම | ඩබ්. ඒ. පුෂ්පා මියගේ ඉඩම | 805 D වැත්තෑව |
| 15 | අළුබෝගහලන්ද දෙවන හරස් මාර්ගය | 64 | 3 | පිඹුර අංක 1519 කැබලි අංක 1 දරන ඩබ්. ඒ. පුෂ්පා මියගේ ඉඩම | ජී. වී. සිරිවිමල් මහතාගේ ඉඩම | 805 D වැත්තෑව |
| 16 | සාමකන්ද හරහා පෙත්ත කන්දට වැටෙන මාර්ගය | 246 | 3 | දේවාල කන්ද පාර | ජී. ඩී. මාලනී මියගේ ඉඩම | 805 D වැත්තෑව |
| 17 | නිවිතිගල වත්ත පාර පළමු පටුමග | 75 | 3 | නිවිතිගල වත්ත පාර | අයි. එච්. යමුනා උදයංගනී මහත්මියගේ ඉඩම | 805 D වැත්තෑව |
| 18 | ඇටිකුකුළුගොඩැල්ල පළමු පටුමග | 155 | 4.9 | මාවතගොඩ පාර | ඩබ්.ටී.ඩී. නන්දන වික්‍රමසිංහ මහතාගේ ඉඩම | 794 C හොරවල බටහිර |

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ දිග මීටර් | මාර්ග යේ පළල මීටර් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | ග්‍රා.නි. වසම |
|---|---|---|---|---|---|---|
| 19 | බිලිංගහවත්ත පළවන පටුමග | 185.3 | 3.04 | පාන්තිය සාරානන්ද මාවතේ සම්පත් ෆුඩ් සිටි අසල | කේ.එම්.එස්. ගාමිණී මහතාගේ නිවස අසල | 805 E යට්ටෝවිට |
| 20 | මතුගම විලේගොඩ පල්ලිය පාර | 641 | 3.04 | විලේගොඩ පාරේ ඩබ්.ඩී. මෛත්‍රීපාල මහතාගේ නිවස අසල | විලේගොඩ පල්ලිය අසල | 805 E යට්ටෝවිට |
| 21 | සාමකන්ද පාර දෙවන හරස් මාර්ගය | 90 | 3.04 | මතුගම සාමකන්ද පාර | ජයන්ත ලියනාරච්චි මහතාගේ ඉඩම | 805 B මතුගම උතුර |
| 22 | හිඟුරාන බෝපිටිය වත්ත පාර | 242 | අඩි 12 | මතුගම කළුතර ප්‍රධාන පාර | රොෂාන් චමින්ද මහතාගේ ඉඩම | 804 A වැලිමානාන |
| 23 | කිරිපැලතුඩුව පාර | 220 | 3 | යටදොල අළුත්ගම ප්‍රධාන මාර්ගය | ඩබ්.ඩී. ධර්මදාස මහතාගේ ඉඩම | 797 ඒ පුස්සලමුල්ල |
| 24 | බකිනිගහලන්ද පාර | 75 | අඩි 9 | මතුගම අගලවත්ත ප්‍රධාන පාර | මතාතුගල සෙට්ටිආරච්චි මහතාගේ ඉඩම | 805 D වැත්තෑව |
| 25 | අග්ගොනයාවත්ත පාර | 125 | අඩි 16 | සෙන්දනායක මාවත | කේ.ඒ. රංජිත් මහතාගේ ඉඩම | 805 B මතුගම බටහිර |
| 26 | ඇතුලත්මුදලිගම සමගි මාවත | 57 | 3 | ආඳගල පාර | කේ.ඩී.මංජුල ක්‍රිශාන්ත මහතාගේ ඉඩම | 805 D මතුගම නැගෙනහිර |
| 27 | ඇතුලත්මුදලිගම එස්.ඒ. වෙල්ගම මාවත | 114 | අඩි 8 | ආඳගල පාර | පී. ධම්මික ප්‍රියදර්ශන මහතාගේ ඉඩම | 805 D මතුගම නැගෙනහිර |
| 28 | ඇතුලත්මුදලිගම එස්. ඒ. වෙල්ගම 1 වන මාවත | 60 | 3 | ආඳාගල පාර | ඩබ්.එල්. සුමනාවතී මහත්මියගේ ඉඩම | 805 D මතුගම නැගෙනහිර |
| 29 | බදුගම 7 වන මාවතේ 3 වන පටුමග | 65.5 | අඩි 12 | බදුගම 7 වන මාවත | ඩී.ආර්.ටී. ලොකුකැටගොඩ මහත්මියගේ ඉඩම | 795 A බදුගම |
| 30 | පැරණි රෝහල් පටුමග | 100 | අඩි 12 | බණ්ඩාරනායක මාවත | පී.වී. විජේදාස මහතාගේ ඉඩම | 805 D මතුගම නැගෙනහිර |
| 31 | හොරවල සමගි මාවත | 300 | 3 | අළුත්ගම මතුගම ප්‍රධාන පාර | හේමන්ත පුෂ්පකුමාර මහතාගේ ඉඩම අවසානයේ | 794 C හොරවල බටහිර |
| 32 | දෙබරබැදිහේනට පිවිසෙන අතුරු මාර්ගය | 135 | 3 | බෝපිටිය සෝමපාල මාවත | කේ.ඩී.සී. මල්ලිකා ජයතිලක මහත්මියගේ ඉඩම | 802 බෝපිටිය නැගෙනහිර |
| 33 | දම්පරාවත්ත පාර | 130 | අඩි 7 | බෙල්ලන මාර්ගය | කේ.ඩී. මල්ලිකා මහත්මියගේ ඉඩම | 804 පාන්තිය |
| 34 | ගුරුපුරය 1 වන මාවත | 200 | අඩි 20 | ආඳගල පාර | කසුන් එදිරිසිංහ මහතාගේ ඉඩම | 804 පාන්තිය |
| 35 | රත්නායක වත්ත පාර | 140 | අඩි 12 | වැල්කන්දල පාර | ඩබ්. ඒ. සමන් උදයතිලක මහතාගේ ඉඩම | 804 පාන්තිය |

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ දිග මීටර් | මාර්ග යේ පළල මීටර් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | ග්‍රා.නි. වසම |
|---|---|---|---|---|---|---|
| 36 | මද්දේගෙදර වත්ත ස්ටෝරුව පාර | 367.8 | අඩි 12 | මද්දේගෙදර වත්ත පාර | ඩබ්. ඒ. වීරසිංහ මහතාගේ ඉඩම | 805 C මතුගම දකුණ |
| 37 | මද්දේගෙදර වත්ත ස්ටෝරුව පාර 1 වන පටුමග | 100 | අඩි 12 | මද්දේගෙදර වත්ත ස්ටෝරුව පාර | කේ.ඒ. රසික ලසන්ත මහතාගේ ඉඩම | 805 C මතුගම දකුණ |
| 38 | අඹේමුල්ල මාර්ගය | 395 | 3 | අඹේමුල්ල මාර්ගයේ අගලවත්ත ප්‍රාදේශීය සභා මායිම | හැලඹ රජයේ වත්ත | 805 D වැත්තෑව |
| 39 | හොරකඳමුල්ල මුණසිංහ මාවත | 233 | 5 | හොරකඳමුල්ල පාර | ආර්.පී.ඩී.ඩී.එම්. රණවීර මහතාගේ ඉඩම | 805 බී මතුගම උතුර |
| 40 | කහටගහවත්ත මාර්ගය | 765 | 3.65 | හිජ්රා මාවත | වැලිපැන්න පාසල පාර | 793 B වැලිපැන්න නැගෙනහිර |
| 41 | කහටගහවත්ත පළමු අතුරු මාර්ගය | 182.6 | 4.57 | කහටගහවත්ත මාර්ගය | කහටගහවත්ත මාර්ගය | 793 B වැලිපැන්න නැගෙනහිර උතුර |
| 42 | කහටගහවත්ත දෙවන අතුරු මාර්ගය | 380 | 6 | කහටගහවත්ත මාර්ගය | කහටගහවත්ත වෙන්දේසි ඉඩම | 793 B වැලිපැන්න නැගෙනහිර උතුර |
| 43 | කහටගහවත්ත දෙවන අතුරු මාර්ගයෙන් පටන්ගන්නා පලවන අතුරු මාර්ගය | 225 | 6 | කහටගහවත්ත පාරේ දෙවන අතුරු මාර්ගය | කහටගහවත්ත පාරේ දෙවන අතුරු මාර්ගය | 793 B වැලිපැන්න නැගෙනහිර උතුර |
| 44 | කහටගහවත්ත දෙවන අතුරු මාර්ගයෙන් පටන් ගන්නා තුන්වන අතුරු මාර්ගය | 105 | 6 | කහටගහවත්ත පාරේ දෙවන අතුරු මාර්ගයේ පළමු අතුරු මාර්ගය | කහටගහවත්ත මාර්ග යෙන් පටන් ගන්නා දෙවන අතුරු මාර්ගයෙන් ආරම්භවන පළමු අතුරු මාර්ගය | 793 B වැලිපැන්න නැගෙනහිර උතුර |
| 45 | කහටගහවත්ත දෙවන අතුරු මාර්ගයෙන් පටන්ගන්නා දෙවන අතුරු මාර්ගය | 69 | 4.57 | කහටගහවත්ත පාරේ දෙවන අතුරු මාර්ගය | දෙවන අතුරු මාර්ග යෙන් පටන් ගන්නා පළමු අතුරු මාර්ගය | 793 B වැලිපැන්න නැගෙනහිර උතුර |
| 46 | කහටගහවත්ත මාර්ග යෙන් ආරම්භවන තුන්වන අතුරු මාර්ගය | 100 | 4.57 | කහටගහවත්ත මාර්ගය | කුඹුරුයාය | 793 B වැලිපැන්න නැගෙනහිර උතුර |
| 47 | වැල්කන්දල උඩුමුල්ල පාර | 346 | අඩි 12 | වැල්කන්දල පාර | අයි. එච්. ඉරේෂා මහත්මියගේ ඉඩම | 804 පාන්තිය |
| 48 | ගුරුදෙල වෙන්දේසිවත්ත පාර | 139 | 4.5 | ගුරුදොල පාර | කරුණාදාස වික්‍රමනායක මහතාගේ ඉඩම | 806 සී ගුරුදොල |
| 49 | නුගගහකුරුදූවත්ත පාර | 115 | 3 | කළුතර - මතුගම ප්‍රධාන පාර | ඩබ්. කේ. විජේසේන මහතාගේ නිවස | 805 ඒ මතුගම බටහිර |
| 50 | උතුරු පල්ලියගොඩ මස්සලයාවත්ත පාර | 90 | 3 | පාන්තිය සෙන්දනායක මාවතේ කෝලිත සෙන්දනායක මහතාගේ නිවස | කේ.ඒ. රංජිත් මහතාගේ නිවස | 805 A මතුගම බටහිර |

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ දිග මීටර් | මාර්ග යේ පළල මීටර් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | ග්‍රා.නි. වසම |
|---|---|---|---|---|---|---|
| 51 | හොරවල අම්බලන්දූවවත්ත පාර | 130 | 6 | හොරවල අළුත්ගම පාර RDA කාර්යාලය | සහන් කාරියවසම් මහතාගේ ඉඩම | 794 හොරවල |
| 52 | ඩී.ආර්. සමිත් වීරසිංහ මහතාගේ නිවසේ සිට වෛද්‍ය නාලක ජයසිංහ මහතාගේ නිවස දක්වා පාර | 175 | 4.57 | ඩී.ආර්. සමිත් වීරසිංහ මහතාගේ නිවස | වෛද්‍ය නාලක ජයසිංහ මහතාගේ නිවස | 805 D වැත්තෑව |
| 53 | පාන්තිය ධර්මරාජ මාවතේ පළමු අතුරු මාර්ගය | 100 | 4.5 | ධර්මරාජ මාවත | ඒ. ටී. රත්නපාල මහතාගේ නිවස | 805 A මතුගම බටහිර |

**දෙල්ගහවත්ත මාර්ගය**


| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | අවසානය | මාර්ගයේ දිග | මාර්ගයේ පළල | මිනින්දෝරු වරයාගේ නම | පිඹුරුපත් අංකය හා දිනය | ග්‍රාම නිලධාරී වසම හා අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | දෙන්ගහවත්ත මාර්ගය | සෙන්දනායක මාවත | හැන්ඩි සෙන්දනායක මහතාගේ ඉඩම | 100 | 2.43 | ඩබ්. ඒ. විජිත කේ. පියරත්න | 2002 2018.02.26 | 805 ඒ මතුගම බටහිර |

ඩබ්ලිව්.ඒ.විජිත කේ පියරත්න.
බලයලත් මිනින්දෝරු සහ උසාවි කොමසාරිස්
60 සී, ආදගල පාර, මතුගම.
දු:කථ: 034-2247665

## පිඹුරු අංකය- 2002.

මතුගම ප්‍රාදේශීය සභාවේ ඉල්ලීමේ අංක- මතු/ප්‍රස/8/2/පොදු. සහ 2017-10-03 දිනැති.

සෙන්දනායක මාවතේ සිට දෙල්ගහවත්ත හරහා හැන්ඩි සෙන්දනායකගේ ඉඩම දක්වා ඇති පොදු පාර මතුගම ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සඳහා මැනීම.




සටහන-
පිඹුරු අංක 1940 හි කැබලි අංක-18 හි මායිම් අධිස්ථාපනය කර රතු පාටින් පෙන්වා ඇත

පරිමාණය 1 : 500

බස්නාහිර පළාතේ
කළුතර දිස්ත්‍රික්කයේ

බටහිර පස්දුන් කෝරළයේ ඉද්දගොඩ පත්තුවේ, මතුගම ප්‍රාදේශීය ලේකම් සහ සභා සීමාව තුළ පල්ලිගොඩ ගමේ පිහිටි "දෙල්ගහවත්ත" නැමති ඉඩමේ ඇති පාර (කළුතර දිස අධිකරණයේ නඩු අංක- 28103 දරන නඩුවේ අවසාන බෙදුම් පිඹුර-1940 හි කැබලි අංක -18 ලෙස ඇති පාර, මතුගම ප්‍රාදේශීය සභාවට අත්කර ගැනීම සඳහා නැවත මැන පෙන්වන

## —පිඹුර—

ඉඩමට මායිම්-

උතුරට - පිඹුරු අංක 1940 හි කැබලි අංක 6
නැගෙනහිරට - පිඹුරු අංක 1940 හි කැබලි අංක 7,8, 9,10,11,12,14,15,16 සහ 17.
දකුණට - පිඹුරු අංක 1940 හි කැබලි අංක 19 සහ සෙන්දනායක මාවත.
බටහිරට - පිඹුරු අංක 1940 හි කැබලි අංක 19.

ඉඩම් විස්තරය

| කොටස් අංකය | ප්‍රමාණය | | | | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අක්: | රූඩ්: | පර්: | |
| 18 | 0.02567 | 00 | 00 | 10.15 | පාර (පළල අඩි 8.0 -මීටර් 2.43) |

පවතින පාර පුළුල් වී ඇති ස්ථාන වල බිම් ප්‍රමාණ සහ විස්තර.

| කොටස් අංකය | ප්‍රමාණය | | | | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අක්: | රූඩ්: | පර්: | |
| A | 0.00241 | 00 | 00 | 00.95 | කැබල අංක 19 හි කොටසක් |
| B | 0.00003 | 00 | 00 | 00.01 | කැබල අංක 10 හි කොටසක් |
| C | 0.00013 | 00 | 00 | 00.05 | කැබල අංක 11 හි කොටසක් |
| D | 0.00018 | 00 | 00 | 00.07 | කැබල අංක 12 හි කොටසක් |
| E | 0.00069 | 00 | 00 | 00.27 | කැබල අංක 14 හි කොටසක් |
| F | 0.00041 | 00 | 00 | 00.16 | කැබල අංක 15 හි කොටසක් |
| එකතුව | 0.00385 | 00 | 00 | 01.51 | |

මායිම් පෙන්වා දුන්නේ
සහ බලා ගත්තේ - කාර්මික නිලධාරී.
මතුගම ප්‍රාදේශීය සභාව.

"සත්‍ය පිටපත"

2018-01-18 දිනදීය.

ඩබ්ලිව්. ඒ. විජිත කේ පියරත්න
බලයලත් මිනින්දෝරු
උසාවි කොමසාරිස්
60 සී, ආදගල පාර, මතුගම.

අත්සන් කලේ/
ඩබ්ලිව්.ඒ.විජිත කේ පියරත්න.
බලයලත් මිනින්දෝරු

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

## පන්නල ප්‍රාදේශීය සභාව

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධානවලට අනුකූල වන පරිදි පහත උපලේඛනවල සඳහන් පන්නල ප්‍රාදේශීය සභාවේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

එල්. එම්. එස්. කේ. රංජිත් ලංසකාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
පන්නල.

2018 මැයි මස 01 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාවේ දී ය.

## පන්නල ප්‍රාදේශීය සභාව

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය

| | | සටහන් | 31.12.2017 | 31.12.2016 |
|---|---|---|---|---|
| මෙහෙයුම් අයභාරය | | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | | 01 | 101,664,040.82 | 174,129,366.49 |
| වෙනත් අයභාරය | | 02 | 48,434,623.53 | 46,118,918.09 |
| මුළු මෙහෙයුම් අයභාරය | A | | 150,098,664.35 | 220,248,284.58 |
| මෙහෙයුම් වියදම | | | | |
| පුනරාවර්තන වියදම | | 03 | 117,956,166.71 | 113,481,902.22 |
| මුළු මෙහෙයුම් වියදම | B | | 117,956,166.71 | 113,481,902.22 |
| වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/ ඌනතාවය | | A-B=C | 32,142,497.64 | 106,766,382.36 |
| ප්‍රාග්ධන ලැබීම් | D | 04 | 50,826,733.64 | 22,312,564.73 |
| ප්‍රාග්ධන වියදම් | E | 05 | 85,321,403.96 | 39,926,585.72 |
| වර්ෂය සඳහා වන අතිරික්තය/ ඌනතාවය | | C+D-E=F | -2,352,172.68 | 89,152,361.37 |

**පන්නල ප්‍රාදේශීය සභාව**

2017 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 31.12.2017 | 31.12.2016 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 06 | 337,376,676.91 | 316,737,377.50 |
| ජංගම වත්කම් | | | |
| තොග | 07 | 1,881,679.60 | 1,880,229.81 |
| සේවක ණය හා අත්තිකාරම් | 08 | 7,412,011.99 | 2,844,277.98 |
| ලැබිය යුතු දෑ | 09 | 108,659,355.65 | 164,150,336.68 |
| ආයෝජන | 10 | 33,156,896.47 | 1,666,704.00 |
| මුදල් හා මුදල් සමාන දෑ | 11 | 25,558,146.97 | 29,340,702.84 |
| මුළු වත්කම් | | 514,044,767.59 | 516,619,628.81 |
| වගකීම් | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 28,793,741.90 | 35,586,735.66 |
| ජංගම වගකීම් | 13 | 123,706,711.38 | 96,200,539.81 |
| හිමිකම් | 14 | 361,544,314.31 | 384,832,353.34 |
| මුළු හිමිකම් හා වගකීම් | | 514,044,767.59 | 516,619.628.81 |

**පන්නල ප්‍රාදේශීය සභාව**

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | *2017.12.31* | *2016.12.13* |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| සාමානය මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ ඌනතාවය | 32,142,497.64 | 106,766,382.36 |
| මුදල් නොවූ සිදුවීම් සඳහා ගැලපීම් | | |
| ක්ෂය වීම් | | |
| පාරිතෝෂික වෙන් කිරීම් | | |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | -41,575,165.76 | -6,208,332.42 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය | -9,432,668.12 | 100,558,049.94 |

| | | | *2017.12.31* | *2016.12.13* |
|---|---|---|---|---|
| තොග ණයගැතියන්/අනෙකුත් ලැබීම්- වැඩිවීම් (අඩුවීම්) | | | 19,431,604.76 | -33,530,897.85 |
| ණයහිමියන්/ගෙවිය යුතු දෑ - වැඩිවීම් (අඩුවීම්) | | | 27,506,171.57 | -39,172,756.71 |
| 01. මෙහෙයුම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | 37,505,108.21 | 27,854,395.38 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | | |
| දේපළ අත්පත් කරගැනීම්/ඉවත් කිරීම් | | | -21,282,081.43 | -2,160,139.95 |
| ප්‍රාග්ධන වියදම් | | | -64,039,322.53 | -37,766,445.77 |
| 02. ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | - 85,321,403.96 | -39,926,585.72 |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | | |
| ප්‍රාග්ධන ලැබීම් | | | 50,826,733.64 | 22,312,564.73 |
| ණය ආපසු ගෙවීම් | | | -6,792,993,76 | -7,548,764.23 |
| 03. මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | 44,033,739.88 | 14,763,800.50 |
| වර්ෂය තුල ශුද්ධ චලනයන් (1+2+3) | | | -3,782,555.87 | 2,691,610.16 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | | 29,340,702.84 | 26,649,092.68 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන 11) | | | 25,558,146.97 | 29,340,702.84 |
| සටහන 11 | ලංකා බැංකුවේ ජංගම ගිණුම | 3003334 | 17,686,036.15 | 22,548,580.68 |
| | ලංකා බැංකුවේ ජංගම ගිණුම | 3003340 | 5,624,474.68 | 3,239,300.22 |
| | ලංකා බැංකුවේ ජංගම ගිණුම | 73559037 | 1,136,709.50 | 2,555,763.56 |
| | ලංකා බැංකුවේ ජංගම ගිණුම | 70551597 | 624,104,38 | 428,844.38 |
| | ලංකා බැංකුවේ ජංගම ගිණුම | 3441122 | 300,722.02 | 336,718.89 |
| | ලංකා බැංකුවේ ජංගම ගිණුම | 3003335 | 114,661.92 | 160,778.79 |
| | නිලධාරි අතැති මුදල් | | 2,309.33 | 2,309.33 |
| | ඉතිරි මුද්දර | | 35,879.50 | 33,157.50 |
| | අගරු චෙක් | | 33,249.49 | 33,249.49 |
| | | | 25,558,146.97 | 29,340,702.84 |

06 -325

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.